# An introduction to '*Puggalawāda*' depicted in Interdenominational Buddhism

## නිකායාන්තර බුදුසමයෙහි දැක්වෙන පුද්ගලවාද පිළිබඳ හැඳින්වීමක්

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව, බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය නොයෙක් පර්යායයන්ට බෙදා වෙන් කරන ලදී. මෙම බෙදා වෙන්කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පසුකාලීන භික්ෂූහු ධර්මය පිළිබඳ නොයෙකුත් අදහස්, මතවාද ඉදිරිපත් කළහ. මෙසේ ධර්මය පිළිබඳ නොයෙකුත් අදහස් පලවීමත් සමඟ සසුන තුළ භික්ෂූහු නිකාය, ගුරුකුල ආදී වශයෙන් බෙදී කටයුතු කරන්නට වූහ. මෙහි දී, මුල් බුදුසමයාගත ස්කන්ධ, ධාතු. ආයතන ආදි වූ ධර්ම විශ්ලේෂණ පදනම් කොට ථෙරවාදී සම්ප්‍රදායානුගත භික්ෂූහු ''ධර්මවාදය'' නම් සංකල්පයක් ඉදිරිපත් කළහ. මෙම ධර්මවාදය තුළ ලොව පවතින සියලු පුද්ගලවාදි සංකල්පයන් ප්‍රතික්ෂේප වී ඇත.

මෙම අදහසට විරුද්ධව නිර්මාණය වු මතවාදය නම් ''පුද්ගලවාදය''යි. පුද්ගලවාදය තුළින් ස්කන්ධ ධර්මයන්ට අමතරව ලොව සදාකාලිකව පවත්නා පුද්ගලයෙකු පිළිබඳ අදහසක් ඉදිරිපත් වේ. ඔවුන් මෙම අදහස ඉදිරිපත් කිරීමේ දී, මුල් බුදුසමයාගත සූත්‍ර දේශනා තුළ අනතර්ගත කරුණු මූලබීජ කොටගෙන ඇතිබව දැකිය හැක. මෙම අධ්‍යයනය තුළ අප බලාපොරොත්තු වන්නේ පුද්ගලවාදයේ ආරම්භයත්, ඒ සඳහා ථෙරවාදි ධර්මවාදයෙහි බලපෑමත්, පුද්ගලවාදීහු තම ඉගැන්වීමේ දී මූලික සූත්‍රාගත ඉගැන්වීම් කොතරම් දුරට පාදක කොටගන්නේ ද යන්නත් පිළිබඳවත් විමර්ශනය කිරීම යි.

**ථෙරවාදීන්ගේ ධර්මවාදය**

මුල් බුදුසමයාගත ඉගැන්වීම් පිළිබඳ විමසා බැලීමේ දී බෞද්ධ චින්තනයේ කේන්ද්‍රීය සංකල්පයක් ලෙස, ආත්මවාදී සංකල්පය බැහැර කරන්නා වූ, එසේම ලොව යථා ස්වභාවය පෙන්වා දෙන්නා වූ ස්කන්ධ විග්‍රහය දැක්වේ. මෙම ඉගැන්වීම උදෙසා මුල් බුදුසමය තුළ ක්‍රමවේද 02 ක් පදනම් කොටගෙන ඇත. එනම්,

1. විශ්ලේෂණ ක්‍රමය
2. සංස්ලේෂණ ක්‍රමය

විශ්ලේෂණ ක්‍රමවේදය යනු, සත්ත්වයා සහ ලෝකය බෙදා වෙන්කොට දත්ත හෙවත් සාධක මඟින් ලොව යථාස්වභාවය පෙන්වා දීමයි. පුද්ගල, සත්ත්ව ආදි වශයෙන් අප භාවිතා කරනු ලබන සම්මුති ධර්මයෝ ස්කන්ධ, ධාතු, ආයතන ආදි වූ කොටස්වලට බෙදා දැක්වීම මෙහි දී සිදුකරනු ලබයි. පරමාර්ථ දේශනා වශයෙන් සළකනු ලබන්නේ ද මෙම විශ්ලේෂණ ක්‍රමවේදය යි. මෙම ක්‍රමවේදයට අනුව මුල් බුදුමසමයේ දක්නට ලැබෙන ප්‍රධාන විශ්ලේෂණ ක්‍රමවේද 04කි.

1. පඤ්චස්කන්ධ විභාගය
2. ෂඩ්ධාතු විභාගය
3. ද්වාදස ආයතන විභාගය
4. අට්ඨාරස ධාතු විභාගය

"පඤ්චස්කන්ධ විභාගය" යනු, පුද්ගලයා රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන කොටස් පහකට බෙදා වෙන්කිරීම යි. මෙහි රූපය මඟින් සත්ත්වයාගේ "රූප" අංශය ද, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන ධර්ම තුළින් "නාම" අංශය ද අර්ථවත් කොට ඇත.

ෂඩ් ධාතු ආයතනයේ දී ද නැවත පුද්ගලයාගේ වර්ගීකරණයක් දක්නට ඇත. එනම්, පඨවි, ආපො, තෙජො, වායො, ආකාස, විඤ්ඤාණ යන කොටස් හය යි. මෙහි දී මානසික හෙවත් නාම අංශයට වෙන් කොට ඇත්තේ එක් කොටසක් පමණි. එනම් විඤ්ඤාණය යි. අනෙක් ධර්ම පහම භෞතික අංශ නියෝජනය කොට ඇත.

නැවත පුද්ගලයා ආයතන වශයෙන් ද කොටස් දොළොසකට බෙදනු ලබයි. එනම්,

1. චක්ඛායතන
2. සොතායතන
3. ඝාණායතන
4. ජිව්හායතන
5. කායායතන
6. මනායතන
7. රූපායතන
8. ශබ්දායතන
9. ගන්ධායතන
10. රසායතන
11. පොට්ඨබ්බායතන
12. ධම්මායතන

මෙහි මුල් ආයතන හය "අජ්ඣත්තික ආයතන" නම් වන අතර, අවශේෂ ආයතනික හය " බාහිර ආයතන" නම් වේ.

මීට අමතරව පුද්ගලයා නැවත අට්ඨාරසධාතු විභාගය නමින් කොටස් 18 කට බෙදා වෙන් කරනු ලබයි.

1. චක්ඛු
2. සොත
3. ඝාණ
4. ජිව්හා
5. කාය
6. මන
7. රූප
8. ශබ්ද
9. ගන්ධ
10. රස
11. පොට්ඨබ්බ
12. ධම්ම
13. චක්ඛු විඤ්ඤාණය
14. සෝත විඤ්ඤාණය
15. ඝාණ විඤ්ඤාණය
16. ජිව්හා විඤ්ඤාණය
17. කාය විඤ්ඤාණය
18. මනො විඤ්ඤාණය

මෙම ධාතු විභාගයෙහි චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ යන කොටස් පුද්ගලයාගේ භෞතික අංශයට හෙවත් "රූප" කොටසට ඇතුළත් වන අතර, ඉතිරි සියල්ල "නාම" අංශය නියෝජනය කරයි.[1]

මේ ආකරයට මුල් බුදුසමයේ පුද්ගලයා නොයෙක් ආකාරයෙන් විශ්ලේෂණය කොට ඇති අතර, මෙසේ විශ්ලේෂණය කිරීමෙන් පුද්ගලයා ආත්මවාදි සංකල්පයට වැටීමෙන් වළක්වා ගැනීම මුල් බුදුසමයේ පරමාර්ථය වී ඇත. යම් ධර්මයක් සාධකවලට වෙන්කල හැකිනම්, ඒ තුළ නොවෙනස්ව පවතින පදාර්ථයක් දක්නට නොලැබේ නම්, ලොව කිසිවක් "ආත්ම" වශයෙන් සැළකිය නොහැකි බව මුල් බුදුසමයේ ආකල්පයයි.

එසේම මුල් බුදුසමයේ සත්‍වයා සහ ලෝකය විශලේෂණය කිරීමෙන් පමණක් යථාර්ථ දර්ශනය අවසන් කොට නොමැත. එසේ වූ විට ආත්ම බහුත්‍වයක් පිළිබඳ අදහසක් පුද්ගලයා තුළ නිර්මාණය වීමට ඉඩ ඇත. එහෙයින් බෙදා වෙන් කරන ලද සාධක නැවත එක් කොට පෙන්වාදීමක් ද සිදු වී ඇත. එය "සංස්ලේෂණ ක්‍රමය" යනුවෙන් දක්වයි. කොටස්වලට බෙදා වෙන්කරන ලද පුද්ගල මූල සාධක නැවත සංස්ලේෂණය කරනු ලබන්නේ හේතු-ඵල න්‍යායට අනුව ය. මෙහි දී රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ආදී වශයෙන් බෙදූ මූලධර්ම එකතුවීමෙන් පුද්ගලයා නිර්මාණය වන ආකාරය පෙන්වා දී ඇත.

මුල් බුදුසමයේ දක්නට ලැබෙන මෙම ඉගැන්වීම බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව නිර්මාණය වූ නොයෙකුත් දාර්ශනික සංකල්ප උදෙසා පදනම විය. ඔවුන් මෙම විශ්ලේෂණයන් තවදුරටත් බෙදීමට ලක්කළ අතර, එහි කෙළවර දක්වා පැමිණීම ඔවුන්ගේ අරමුණ විය. එසේම මෙහි ප්‍රතිඵලයක් ලෙස ථෙරවාද අභිධර්මාගත ධර්මවාදය නිර්මාණය වූ අතර, මුල් බුදුසමයාගත විශ්ලේෂණයන් පදනම් කොටගෙන නිර්මාණය වූ මෙම ධර්මවාදය තවදුරටත් සංවර්ධනය කොට ආභිධම්මිකයෝ සංඛත ධර්ම 81 ක් පෙන්වා දී ඇත.

| | |
|---|---|
| රූප | 28 |
| වේදනා<br>සංඥා<br>සංඛාර | 52 |
| විඤ්ඤාණ | 01 |
| | 81 |
| නිබ්බාණ | 01 |
| | 82[2] |

මෙහි දී මුල් බුදුසමයෙහි පඤ්චස්කන්ධ විභාගය තුළ වූ රූපය, අභිධර්මයෙහි "රූප පරමාර්ථය" ලෙස සළකා, මහාභූත රූප 04ක් සහ උපාදාය රූප 24 යනුවෙන් අටවිසි රූපයකට

ද ඛන්ධ විභාගයේ වේදනා, සංඥා, සංඛාර අභිධර්මයේ දී චෛතසික ලෙස ගෙන කොටස් 52කට ද, විඤ්ඤාණය චිත්ත පරමාර්ථය ලෙසින් ගෙන අභිධර්මයේ දී එය 01ක් ලෙස ද, යෙදෙන තැන් අනුව එය 89 ක් හා 121ක් ලෙස ද විස්තර කොට ඇත. නිවන ද පරමාර්ථ ධර්මයක් වූ බැවින් අසංඛත ධර්මයක් ලෙස ඇතුළත් කොට ඇත.

මෙසේ ධර්මවාදීන්ගේ මෙම අභිධර්ම විග්‍රහය තුළ සියල්ල විශ්ලේෂණය කළ අතර, ඒ අනුව ඔවුන් ලොව "ධර්ම" පමණක් පවතින බවත්, එයට අමතරව කිසිදු ද්‍රව්‍යයක් හෝ ආත්මයක් නොපවතින බවත් තරයේ පිළිගත්හ. විශුද්ධි මාර්ගයේ ද මෙම ධර්මවාදයට අනුව ලොව කර්ම කරන්නෙක් හෝ විපාක විඳින්නෙක් හෝ නැති බවත්, ධර්ම පමණක් පවතින බවත් සඳහන් කොට ඇත.

***''කම්මස්සකාරකො නත්ථි විපාකස්ස ච වෙදකො ..... සුද්ධ ධම්මා පවත්තන්ති''***

එසේම ධර්මවාදීන් ලෝකයේ නිත්‍ය වූ ආත්මයක්, නිත්‍ය වූ පුද්ගලයෙක් නොමැති බවත්, සියල්ල අනිත්‍ය ලක්ෂණයට, විපරිණාමයට භාජනය වන බවත්, ලොව ඇති එකම දේ "ධර්ම" පමණක් බවත් දැක්වූවා සේම, එම ධර්ම වර්තමානයේ පමණක් පවතින බව අවධාරණය කළහ. ඔවුන්ගේ මතයට අනුව අනාගත ධර්ම තවම පැමිණ නැත. අතීත ධර්මයෝ ද පවතින්නේ වර්තමානයේ පමණි. වර්තමානයේ ද ධර්ම ක්ෂණයක් තුළ ඉපි ද, ක්ෂණයක් තුළම විනාශ වී යයි.

**ථෙරවාදී ධර්මවාදය පුද්ගලවාදය බිහිවීමෙහිලා ඉවහල් වූ අයුරු**

ථෙරවාදීන් විසින් මුල් බුදුසමයේ වූ ස්කන්ධ, ධාතු, ආයතන ආදී විග්‍රහයන් පදනම් කොටගෙන ඉදිරිපත් කරන ලද ධර්මවාදය, දාර්ශනික වශයෙන් පසුකාලීනව නොයෙකුත් වාද විවාදයන්ට තුඩු දුන් කරුණක් විය. ථෙරවාදීන්ගේ ධර්මවාදයට අනුව ලොව පවතින්නේ ස්ඛන්ධ, ධාතු, ආයතන ආදී වූ ධර්මතා පමණකි. ඉන් පරිබාහිර වූ කිසිවක් ලොව දක්නට නොලැබෙන අතර, පවතින ධර්ම ද ක්ෂණයක් පාසා අනිත්‍යතා ලක්ෂණයට ගොදුරු වේ. මෙයට අනුව "ධර්ම" වර්තමානයේ පමණක් පවතින අතර, අතීත ධර්ම අතීතයට ගොස් හමාර ය. අනාගත ධර්ම තවමත් පැමිණ නැත.

මෙම ධර්මවාදයට එරෙහිව පළමුව වෙනස් වූ මතයක් ගොඩනගනු ලබන්නේ පුද්ගලවාදීන් ය. ඔවුහු ධර්මවාදයට අනුව ලොව පුද්ගලයෙකු නොමැති නම්, මුල් බුදුසමයේ දක්නට ලැබෙන ඇතැම් බෞද්ධ ඉගැන්වීම් අර්ථවත් කළ නොහැකි බව පෙන්වා දුන්හ. මෙහි දී පුද්ගලවාදීන්ගේ මතය වූයේ, පඤ්චස්ඛන්ධයට අමතරව ලොව "ස්ථිර වූ පුද්ගලයෙක්" සිටින බවය. පුද්ගලවාදීන්ගේ මෙම ඉගැන්වීම තහවුරු කිරීමට ඔවුන් මුල් බුදුසමයාගත ඉගැන්වීම් තුළින්ම දාර්ශනික වූ අදහස් කීපයක් ඉදිරිපත් කොට ඇත.

1. පුද්ගලයෙකු ලොව නැතැයි කී කල, මුල් බුදුසමයෙහි දක්වන නිවන පිණිස පෙරුම් පිරීමේ දී භවයෙන් භවය ගමන් කරන්නා වූ පුද්ගලයෙකු අර්ථවත් කළ නොහැක. දිගු කලක් පෙරුම් පුරා සසරින් එතෙර වන බව සැබෑ නම්, විමුක්තිය ලැබූ තැනැත්තා ද පෙරුම්දම් පිරූ තැනැත්තා ද එකම පුද්ගලයෙකු විය යුතුය. පෙරුම් පිරීමේ දී සාංසාරික පුද්ගලයෙකු

නොසිටියේ නම් පෙරුම් පිරීමත් නිවන් දැකීමත් පුද්ගලයන් දෙදෙනෙකු විසින් කරන ලැදැයි කීමට සිදු වේ.[3]

2. මතකය හෙවත් ස්මෘතිය විස්තර කිරීමට නම් පුද්ගලයෙකු ඇතැයි පිළිගත යුතුය. නාම - රූප ධර්මයෝ නිරන්තරයෙන් වෙනස් වෙති. අද්දැකීමක් පවත්නේ මොහොතකි. එසේ නම් අතීත අනුභූතීන්ගේ මතකය රඳා පවතින්නේ කෙසේ ද? එසේනම් පුද්ගලයා නිත්‍ය ය. නාම රූප විනාශ වුව ද මතකය පුද්ගලයා තුළ රඳා පවතී යැයි පිළිගත යුතුය.[4]

3. කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් යථා පරිදි විස්තර කිරීමට ද පුද්ගලයෙකු ඇතැයි පිළිගත යුතුවෙයි. එසේ නොවේ නම්, කුසලාකුසල කර්ම කරන්නේ එක් අයෙකි. විපාක විඳින්නේ වෙනත් අයෙකැයි කීමට සිදුවෙයි. කර්ම කරන්නාම විපාක විඳියිනම්, ඒ සඳහා නොවෙනස් වන්නා වූ පුද්ගලයෙකු සිටිය යුතුය.[5]

4. පුද්ගලයෙකු සත්වයෙකු නැත්තේ යැයි ඉඳුරා ප්‍රකාශ කිරීම බෞද්ධ ආචාර ධර්මයන් අර්ථවත් කිරීමට බාධාවකි. එවිට කරුණාව මෛත්‍රිය ආදී ආචාර ධර්ම අර්ථ ශූන්‍ය විය හැකිය. එබැවින් එකී ආචාර ධර්ම සම්පූර්ණ කරන්නා වූ පුද්ගලයෙකු ඇතැයි පිළිගත යුතුය.[6]

මේ ආදී වශයෙන් පුද්ගලවාදීන් මුල් බුදුසමයේ ම අදහස් පදනම් කොටගෙන තම මතය තහවුරු කිරීම පිණිස නොයෙකුත් තර්ක ඉදිරිපත් කොට ඇති ආකාරය දක්නට ලැබේ. ඔවුන් මෙසේ අදහස් ඉදිරිපත් කරනු ලැබුවේ, ධර්මවාදීන් විසින් දක්වන ලද ධර්මවාදයට විරුද්ධව ය. එසේ බලන කල පුද්ගලවාද බිහිවීමේලා පදනම වී ඇත්තේ ථෙරවාදීන්ගේ ධර්මවාදය බව ඉතා පැහැදිලි ය.

ථෙරවාදීන්ගේ ධර්මවාදයට පිළිතුරක් ලෙස නිර්මාණය වූ මෙම පුද්ගලවාදයෙහි ආරම්භකයා ථෙරවාදී සම්ප්‍රදායේම වියත් භික්ෂුවක වූ වාත්සීපුත්‍ර නම් ස්ථවිරයන් වහන්සේ නමකි.[7] පසුකලෙක ගුරුකුලයක් වූ පුද්ගලවාදීහු උන්වහන්සේගේ නමින් මෙය "වාත්සීපුත්‍රීය ගුරුකුලය" ලෙස ද " වාත්සීපුත්‍ර සම්මිතීය නිකාය" ලෙස ද හඳුන්වා ඇත.

ථෙරවාදය තුළ මහත් වූ ආන්දෝලනයක් ඇති කල මෙම පුද්ගලවාදයට විරුද්ධව ධර්මවාදීහු නොයෙකුත් තර්ක ඉදිරිපත් කළහ. ඇතැම් විට පුද්ගලවාදය ආත්මවාදයක් ලෙසට චෝදනා කරන්නට වූහ. නමුත් පුද්ගලවාදීහු තම ඉගැන්වීම ආත්මවාදයක් ලෙස කිසිවිටෙකත් පෙන්වා නොදුන්හ. ඔවුන් දක්වන මෙම පුද්ගල සංකල්පය පඤ්චස්කන්ධයට අයත් වූවක් ලෙස ද, අනන්‍ය වූ ලෙස ද විස්තර කොට ඇත. ඒ සඳහා ඔවුන් ගින්න සහ ඉන්දන උදාහරණයට ගෙන ඇත. ගින්න ඉන්දන හා අන්‍ය ද නොවේ. අනන්‍ය ද නොවේ. එසේම ගින්න යනු හුදු ප්‍රඥප්තියක් පමණක් ද නොවේ.[8] මේ ආදී වූ නිදසුන් මඟින් ඔවුන් තම පුද්ගලවාදී ඉගැන්වීම ආත්මවාදී දෘෂ්ටියෙන් බැහැර වූවක් ලෙස පෙන්වා දීමට උත්සහ දරා ඇත.

මෙසේ පුද්ගලවාදය ථෙරවාදී ආභිධම්මිකයන්ගේ පුද්ගල නිෂේධනය පදනම් වූ ධර්මවාදයට එරෙහිව නිර්මාණය වූ ගුරුකුලයක් වන අතර, පසුකාලීනව ශාසන ඉතිහාසයේ බිහි වූ නිකායන් අතුරින් වාස්සිපුත්‍රීය, ධම්මෝත්තරීය, සම්මිතීය යන නිකායන් මෙම පුද්ගලවාදය පිළිගත් බව දක්නට ඇත.

**පුද්ගලවාදය තහවුරු කිරීමේලා උපයුක්ත මූලාශ්‍රමය සාදක**

පුද්ගලවාදය නිර්මාණය වනුයේ ධර්මවාදය ප්‍රතික්ෂේප කිරීමක් ලෙස ය. මෙහි දී පුද්ගලවාදීන් ලොව පවත්නා එකම සාධකය ධර්ම පමණක්ය යන ඉගැන්වීමට එරෙහි වූ අතර, ඔවුහු ලොව පවත්නා පුද්ගලවාදී සංකල්පයන් පිළිබඳ කරුණු ඉදිරිපත් කළහ. මෙම ඉගැන්වීම තහවුරු කිරීම පිණිස ඉදිරිපත් කරන ලද සාධක පිළිබඳ විමසා බැලීමේ දී ඉන් වැඩි ප්‍රමාණයක් මුල් බුදුසමයාගත ඉගැන්වීම් වීම සුවිශේෂී කරුණකි. මුල් බුදුසමයේ පුද්ගලයෙකු පිළිබඳ දක්නට ලැබෙන ඇතැම් සූත්‍ර දේශනා තර්කානුකූලව රැගෙන ඔවුන් මෙම ඉගැන්වීම බිහිකොට ඇත.

පුද්ගලවාදය තහවුරු කිරීමේ දී ඉතා වැදගත් සූත්‍රයක් ලෙස ඔවුන් පෙන්වා දෙනුයේ සංයුත්ත නිකායෙහි, ඛන්ධ සංයුත්තයේ භාරහාර සූත්‍රය යි. මෙම සූත්‍රයේ දැක්වෙන,

***''කතමො භික්ඛවෙ භාරො? පඤ්චුපාදානක්ඛන්ධා තිස්ස වචනීයං. කතමෙ පංච? සෙය්‍යථීදං, රූපූපාදනක්ඛන්ධො වෙදනුපාදානක්ඛන්ධො..... විඤ්ඤාණුපාදානක්ඛන්ධො අයං වුච්චති භික්ඛවෙ භාරො. කතමො ච භික්ඛවෙ භාරහාරො? පුග්ගලො තිස්ස වචනීයං. යොයං ආයස්මා එවං නාමො එවං ගොත්තො අයං වුච්චති භික්ඛවෙ භාරහාරො''[9]***

මෙම දේශනාවට අනුව බරක් මෙන්ම, එම බර දරා සිටින්නෙකු හා බර ගෙනියන්නෙකු පිළිබඳව සඳහන් වේ. මෙහි දී බුද්ධ දේශනාවට අනුව ''භාර'' යනුවෙන් අදහස් කරන ලද්දේ පඤ්ච උපාදානස්ඛන්ධය යි. එසේම ''භාර'' යනු එම බර ගෙනයනු ලබන පුද්ගලයා ය. මෙසේ පඤ්ච උපාදානක්ඛන්ධය නැමැති බර උසුලාගෙන යාම උදෙසා යම් පුද්ගලයෙකු සිටිය යුතු බව පුද්ගලවාදීන්ගේ මතයයි.

මීට අමතරව සං.නි. න තුම්හාකං සූත්‍රය ද පුද්ගලවාදීන්ගේ ඉගැන්වීම් සඳහා පාදක වන්නා වූ තවත් සූත්‍ර දේශනාවකි. මෙහි දැකවෙන,

***''චක්ඛුං භික්ඛවෙ න තුම්හාකං තං පජහථ තං බො පහීනං හිතාය සුඛාය භවිස්සති...''[10]***

යන දේශනාවට අනුව චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, ආදී වූ ඉන්ද්‍රියයන්ට අමතරව යම් පුද්ගලයෙකු පවතියි යන අදහස ගම්‍ය වේ. තවද මූලික සූත්‍ර දේශනා තුළ දක්නට ලැබෙන,

***''අත්ථි පුග්ගලො අත්තහිතාය පටිපන්නො''***

***''එකපුග්ගලො ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජන හිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය''***

ආදි දේශනාවන් ද පුද්ගලවාදීහු තම ඉගැන්වීමේ දී උදාහරණ ලෙස දැක්වූහ.

අභිධර්ම පිටකයට අයත් කතාවත්ථුප්‍රකරණය පිළිබඳ විමසා බැලීමේ දී එහි පළමු පරිච්ඡේදය වෙන් වී ඇත්තේ මෙම පුද්ගලවාදය විස්තර කරලීම සඳහා ය. මෙහි දී පුද්ගලවාදය තහවුරු කිරීම පිණිස පුද්ගලයෙකු පවතී යැයි දක්වන්නා වූ අවස්ථා රාශියක් දක්නට ඇත.

***''වුත්තං භගවතා අත්ථි පුග්ගලො අත්තහිතාය පටිපන්නො රූපසුඛ උපලභන්ති සච්චිකට්ඨපරමත්ථෙනා ති''***

***ස. පටිපස්සෙද්ධා ''ආමන්තා''***[11]

මෙයට අනුව තමාගේ හිත සුව පිණිස පිළිපන් පුද්ගලයෙකු ඇති බව සඳහන් වේ. එසේම සත්වරක් පමණක් නැවත ඉපදී දුක කෙළවර කරන්නා ව පුද්ගලයෙකු පිළිබඳව ද මෙහි සඳහන් වී ඇත.

***''සත්තක්ඛත්තු පරමං සන්ධාවිත්වාන පුග්ගලො දුක්ඛස්සන්තකරො හොති සබ්බසංයොජනක්ඛයා ති. අත්ථෙ ච සුත්තන්තො ති - ආමන්තා''***[12]

මීට අමතරව විශුද්ධ වූ දිව්‍ය චක්ෂුවෙන් කර්මානුරූපීව මැරෙන ඉපදෙන හීන - ප්‍රණීත, සුවර්ණ - දුර්වර්ණ, සුගති ප්‍රාප්ත - දුගති ප්‍රාප්ත සත්වයන් දකිමි' යන බුද්ධ දේශනාව ද මෙම පුද්ගලවාදය සඳහා මූලබීජ වී ඇත.

***''පස්සාමහං භික්ඛවෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි ති අත්ථෙ ච සුත්තන්තො ති - ආමන්තා''***[13]

තව ද පුරිසපුද්ගලයන් අට දෙනෙකු පිළිබඳ හෙවත් පුරිස යුග හතරක් පිළිබඳව ද,

***''චත්තාරො පුරිසයුගා අට්ඨපුරිස පුග්ගලා බුද්ධ පාතුභාවො නිතුනවන්ති ති - ආමන්තා''***[14]

කයෙහි, කය නුවණින් දකිමින් වාසය කරන්නා වූ පුද්ගලයෙකු පිළිබඳව ද,

***''අත්ථි කොචි කායෙ කායානුපස්සී විහරති ති කත්වා තෙන ච කාරණෙන පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨාපරමත්ථෙනා ති''***[15]

මෙසේ දක්වෙන්නා වූ දේශනාපාඨ පුද්ගලවාදයසඳහා මූලාශ්‍රය වී ඇත. මීට අමතරව බොහෝ දෙව් මිනිසුන්ගේ හිත සුව පිණිස ලොව උපදින එක් පුද්ගලයෙකු පිළිබඳව ද කථාවත්ථුප්පකරණයේ සඳහන් වී ඇත.

***''වුත්තං භගවතා එකපුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති බහුජන හිතාය බහුජන සුඛාය ලොකානුකම්පකාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානන්ති. අත්ථෙ ච සුත්තෙතා ති. - ආමන්තා''***[16]

මේ ආදී වශයෙන් කථාවත්ථුප්පකරණයේ දක්නට ලැබෙන මෙම කරුණු විමසා බැලීමේ දී පුද්ගලවාදීන් තම ඉගැන්වීම තහවුරු කිරීම පිණිස ඉදිරිපත් කරනු ලබන සාධක මුල් බුදුසමයෙහි සූත්‍රාන්ත තුළම දක්නට ලැබෙන කරුණු බව පැහැදිලි වේ.

[1] බෞද්ධ අධ්‍යයන ප්‍රවේශය, දේවාලේගම මේධානන්ද හිමි, 05 පරිච්ඡේදය, 72 පිට, 2007, සරස්වතී මුද්‍රණ

[2] මුල් බුදුදහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්, සනත් නානායක්කාර, 03 පරිච්ඡේදය, 40 පිට, 2003.

[3] චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්, දේවාලේගම මේධානන්ද හිමි, 03 පරිච්ඡේදය, 58 පිට, 1989, අරිය ප්‍රකාශකයෝ.

[4] එම.

[5] එම.

[6] එම.

[7] මුල් බුදු දහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්, සනත් නානායක්කාර, 05 පරිච්ඡේදය, 52 පිට.

[8] එම.

[9] සං.නි. ඛන්ධ සංයුක්තය, භාරහාර සූත්‍රය

[10] සං.නි. න තුම්හාකං සූත්‍රය

[11] අභි. පි. කථාවත්ථුප්පකරණ පාළි, පඨම වග්ගො පුග්ගල කථා, 36 පිට, බු.ජ.මු.

[12] එම. 88 පිට.

[13] එම. 124 පිට.

[14] එම. 162 පිට.

[15] එම. 174 පිට.

[16] එම. 178 පිට.